7th International Conference of Multidisciplinary Approaches (iCMA), 2020
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# නව කොරෝනා වෛරස ව්‍යාප්තිය හමුවේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන් මුහුණ දුන් ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

කෞශල්‍යා ජී.එන්.* සහ විජේරත්න වී.පී.අයි.එස්.

භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
gnnipuni011@gmail.com

**සාරසංක්ෂේපය**

කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් වර්තමානයේ ලෝකයේ බොහෝ රටවල අවිනිශ්චිත තත්ත්වයන් රැසක් උද්ගත වී ඇත. සෑම රටක ම පාහේ දේශපාලනික, ආර්ථික, සාමාජීය, සෞඛ්‍ය සහ පාරිසරික තත්වයන් වෙනස්වීම කෙරෙහි මෙම වසංගතයේ බලපෑම් එල්ල වී ඇත. මේ අතර කැපී පෙනෙන වෙනස්කම් රැසකට භාජනය වූ අංශයක් ලෙසට අධ්‍යාපන ක්ෂේත්‍රය හඳුනාගත හැකි ය. එහි දී, විශ්වවිද්‍යාල අධ්‍යාපනය අඛණ්ඩ ව පවත්වා ගැනීම උදෙසා විවිධාකාර වූ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම ලෝකයේ බොහෝ රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ද දැකිය හැකි ය. මාර්ගගත අධ්‍යාපනය, තාක්ෂණික ක්‍රමවේද හා සමාජමාධ්‍ය වැනි ක්‍රමවේදයන් භාවිතයෙන් අධ්‍යාපන කටයුතු අඛණ්ඩ ව පවත්වා ගැනීම මෙහි දී කැපී පෙනේ. කෝවිඩ්-19 වසංගතය සමඟ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ සිදු වූ වෙනස්කම් විශ්වවිද්‍යාල සිසුන් සඳහා ධනාත්මක ව මෙන් ම ඍණාත්මක ව බලපෑම් කර ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ ලෙස කොරෝනා වසංගත කාල සීමාවේ දී අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් සමඟ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන්ට උද්ගත වූ ගැටලු හඳුනාගත් අතර අධ්‍යාපනික වෙනස්කම් හේතුවෙන් සිසුන්ට ඇති වූ ධනාත්මක සහ ඍණාත්මක බලපෑම් අධ්‍යයනය ද මෙම අධ්‍යයනයේ තවත් අරමුණකි. මේ සඳහා ප්‍රාථමික සහ ද්විතීයික දත්ත භාවිතයට ගත් අතර ප්‍රාථමික දත්ත ප්‍රමුඛ ව ම විශ්වවිද්‍යාල 6ක (කොළඹ, කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර, මොරටුව, ශ්‍රීපාලි මණ්ඩපය සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය) සිසුන් වෙත යොමු කරන ලද ගූගල් පෝරමයකට ප්‍රතිචාර දැක්වූවන් 50ක් මඟින් ලබාගෙන ඇත. ඒ අතරින් එක් විශ්වවිද්‍යාලයකින් සිසුන් දෙදෙනෙකු බැගින් අහඹු ලෙසට තෝරාගෙන සම්මුඛ සාකච්ඡා මඟින් වැඩිදුර තොරතුරු රැස්කරනු ලැබී ය. එසේ ම සාහිත්‍ය විමර්ශනය මඟින් ශ්‍රී ලංකාවේ මෙන් ම ගෝලීය වශයෙන් වසංගත ව්‍යාප්තිය සමඟ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවූ ගැටලු සහ බලපෑම් හඳුනාගන්නා ලදි. ගැටලු ගසක් සහ SWOT විශ්ලේෂණ ක්‍රමවේදය මෙන් ම විස්තරාත්මක සංඛ්‍යානය යන ක්‍රමවේදයන් යොදාගනිමින් දත්ත විශ්ලේෂණය සිදුකරනු ලැබී ය. මෙහි දී විශ්වවිද්‍යාල සිසුන්ට ඇතිවූ ප්‍රමුඛතම ගැටලු ලෙසට අන්තර්ජාල සබඳතා සඳහා පහසුකම් නොමැති වීම, පුස්තකාල භාවිතයට ඇති අවස්ථාව ගිලිහීයාම සහ පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාමේ දී ඇතිවන ගැටලු කැපී පෙනේ. එය ප්‍රතිශතයක් ලෙසට පිළිවෙලින් 65%, 88%, සහ 79% යන අගයන් ගනී. එසේ ම SWOT විශ්ලේෂණයට අනුව, විශ්වවිද්‍යාල අධ්‍යාපනික කටයුතු අඛණ්ඩ ව පවත්වාගෙන යාමට විශ්වවිද්‍යාල සිසුන්ට පැවති ශක්තියක් ලෙසට නවීන අධ්‍යාපනික ක්‍රමවේද පිළිබඳ පැවති අවබෝධය ද, අවස්ථාවන් ලෙසට කාලය ඉතිරිවීම සහ දේශන නැවත නැවත නැරඹිය හැකි වීම දැක්විය හැකි ය. එසේ ම පුස්තකාල භාවිතයට නො හැකි වීම වැනි දුර්වලතාවන් ද, පර්යේෂණ කටයුතු අඩාල වීම සහ ශක්තිමත් දූරකථන සංඥා නොමැතිවීම වැනි තර්ජන ද පැවති බව පෙනේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවන්නා වූ වෙනස්කම් සමඟ විශ්වවිද්‍යාල සිසුන් මුහුණදෙන ගැටලුකාරී තත්ත්ව හඳුනාගැනීම සඳහා සිදු කළ මෙම අධ්‍යයනය විශ්වවිද්‍යාල සිසුන්ගේ අධ්‍යාපනය නගා සිටුවීමට මහෝපකාරී වනු ඇත.

***ප්‍රමුඛ පද:*** කෝවිඩ්-19 වසංගතය, අධ්‍යාපන ක්ෂේත්‍රය, විශ්වවිද්‍යාල අධ්‍යාපනය, SWOT විශ්ලේෂණය, මාර්ගගත අධ්‍යාපනය